සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# රාජකීය විද්‍යාලය - කොළඹ 07

## තුන්වන වාර පරීක්ෂණය - 2025 ඔක්තෝම්බර්

## 13 ශ්‍රේණිය

## සාමාන්‍ය පොදු පරීක්ෂණය

AL API ( PAPERS GROUP )

කාලය : පැය 2

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. එක්සත් ජාතීන්ගේ (UN) මූලස්ථානය පිහිටා ඇත්තේ කුමන නගරයේ ද?
(1) ලන්ඩන් (2) නිව්යෝර්ක් (3) ජෙනීවා
(4) වොෂින්ටන් DC (5) පැරිස්

2. "Nobel peace prize" ප්‍රදානය කරන්නේ කුමන නගරයේ ද?
(1) ස්ටොක්හෝම් (ස්වීඩන්) (2) ඔස්ලෝ (නෝර්වේ)
(3) පැරිස් (ප්‍රංශය) (4) ජෙනීවා (ස්විස්) (5) ලන්ඩන් (එංගලන්තය)

3. මනෝ විද්‍යාවේ පියා ලෙස හැඳින්වෙන්නේ කවුද?
(1) ඇල්බට් අයින්ස්ටයින් (2) සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් (3) ඇරිස්ටෝටල්
(4) ගැලීලියෝ (5) කාන්ට්

4. IMF පිහිට වූ වර්ෂය කුමක්ද?
(1) 1942 (2) 1943 (3) 1944 (4) 1945 (5) 1946

5. ශ්‍රීමත් ආතර් සී. ක්ලාක් නම් සුප්‍රකට විද්‍යා ප්‍රබන්ධකරුවා වර්ෂ 1956 සිට ජීවත් වූයේ ශ්‍රී ලංකාවේ ය. ඔහු පිළිබඳව නිවැරදි ප්‍රකාශය පහත සඳහන් ඒවායින් කවරක් ද?
(1) ඔහු ලියාපදිංචියෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය.
(2) ඔහු වෘත්තීය ජ්‍යෝතිශ්‍යවේදියෙකි.
(3) ඔහු භෞතික විද්‍යාව පිළිබඳව නොබෙල් ත්‍යාග ලාභියෙකු විය.
(4) ඔහු චන්ද්‍රිකා (සැටලයිට්) සන්නිවේදනයේ පියා ලෙස සලකන ලබයි.
(5) ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ කුලපතිවරයෙකු විය.

6. පෘථිවි ගෝලයේ උෂ්ණත්වය ක්‍රමයෙන් වැඩිවන බවට ප්‍රබල සාක්ෂි තිබේ. වායුගෝලයේ අඩංගු තාපය අවුරන එක්තරා වායුවක සාන්ද්‍රණය වැඩිවීම, ඊට ප්‍රධාන හේතුව බව විශ්වාස කරනු ලැබේ. ඒ වායුව කුමක්ද?
(1) ජල වාෂ්ප (2) කාබන්ඩයොක්සයිඩ් (3) කාබන්මොනොක්සයිඩ්
(4) මෙතේන් (5) ක්ලෝරීන්

7. ලතින් ඇමරිකාවේ වාමාංශික ව්‍යාපාරය මෙහෙයවනු ලබන්නේ, පහත සඳහන් කුමන රටේ ජනාධිපති විසින් ද?
(1) බොලිවියාව (2) බ්‍රසීලය (3) චිලි
(4) එල්සැල්වදෝරය (5) වෙනිසියුලාව

8. දහම් පාසල් ගුරු අභ්‍යාස විද්‍යාලය පිහිටා තිබෙන්නේ.

(1) කඩවත රන්මුතුගල (2) කලුතර (3) කැළණිය

(4) අනුරාධපුරය (5) කුරුණෑගල

9. ධන පූර්ණ සංඛ්‍යා දෙකක් පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?

(1) සංඛ්‍යා දෙකම ඉරට්ටේ නම් එවිට එකතුව ද ඉරට්ටේ වේ.


(2) සංඛ්‍යා දෙකම ඉරට්ටේ නම් ඒවායේ ගුණිතය ද ඉරට්ටේ වේ.

(3) සංඛ්‍යා දෙකම ඔත්තේ නම් ඒවායේ එකතුව ඉරට්ටේ වේ.

(4) සංඛ්‍යා දෙකම ඔත්තේ නම් ගුණිතය ඉරට්ටේ වේ.

(5) එක් සංඛ්‍යාවක් ඔත්තේ ද අනෙක ඉරට්ටේ ද නම් එවිට ඒවායේ ගුණිතය ඉරට්ටේ වේ.

10. රූපයේ දක්වා ඇති අයුරින් වෘත්ත තුනක් එකිනෙක ඡේදනය වීමෙන් ප්‍රදේශ හතක් සාදයි. වෘත්ත හතේ එකිනෙක ඡේදනය වීමෙන් ප්‍රදේශ කීයක් සාදයි ද?




(1) 10 (2) 11 (3) 12 (4) 4 (5) 14

11. අංක 11 සහ 12 පදනම් වන්නේ රාති, ජීවා, රුවනි, සුජී, නයනි, අචලා සහ නිලා නැමති කාන්තාන් සම්බන්ධව පහත දී ඇති තොරතුරු මත ය.
නිලාගේ වයස අචලාගේ වයස මෙන් තුන් ගුණයකි.
සුජීගේ වයස අනෙක් සියලු දෙනාටම වඩා අඩුය.
රාතිගේ හා රුවනිගේ වයස් සමාන ය.
ජීවාගේ වයස අචලාගේ සහ නිලාගේ වයස්වල එකතුවට සමාන ය.
නයනිගේ වයස රාති, ජීවා සහ නිලාගේ වයස්වල එකතුවට සමාන ය.
රුවනිගේ වයස ජීවා සහ නිලාගේ වයස්වල එකතුවට සමාන ය.


11. වැඩිම වයසින් යුත් කාන්තාව කවරෙක්ද?

(1) නයනි (2) අචලා (3) ජීවා (4) රුවනි (5) නිලා

12. නයනිගේ වයසින් අඩක් වයස ඇත්තේ කාටද?

(1) නිලා (2) ජීවා (3) රුවනි (4) අචලා (5) නයනි

13. පහත රූපයේ ඇති අරය 1 ක් වන වෘත්ත තුන එකිනෙකට ස්පර්ශ වන ලෙස ඇඳ ඇත.
වෘත්ත අතර ඇති පාටකළ කොටසේ වර්ගඵලය



(1) $\sqrt{3} - \frac{\pi}{2}$ (2) $\frac{\pi}{2} - \sqrt{3}$ (3) $\pi - \sqrt{3}$

(4) $2 - \frac{\pi}{2}$ (5) $\pi + \sqrt{3}$

14. මාළුවෙකුගේ හිස අඟල් 9 ක් දිග ය. උගේ වලිගය කඳේ දිගින් භාගයක සහ හිසේ දිගෙහි එකතුවට සමාන ය. කඳේ දිග හිසේ සහ වලිගයෙහි දිගෙහි එකතුවට සමාන ය. මාළුවාගේ සම්පූර්ණ දිග කොපමණද?

(1) අඟල් 36 (2) අඟල් 54 (3) අඟල් 72 (4) අඟල් 81 (5) අඟල් 64

ප්‍රශ්න අංක 15 සඳහා පහත දී ඇති තොරතුරු භාවිතා කරන්න.

(a) ඝනකයක පැති හය එක් එක් පැත්ත කළු, නිල්, දුඹුරු, කොළ, රතු සහ සුදු යන පාට හයෙන් වර්ණ කර ඇත.

(b) රතු පැත්ත කළු පැත්තට ප්‍රතිවිරුද්ධ පැත්තේ ඇත.

(c) කොළ පැත්ත, රතු පැත්ත හා කළු පැත්ත අතර ඇත.

(d) නිල් පැත්ත හා සුදු පැත්ත එකිනෙකට යාබදව ඇත.

(e) දුඹුරු පැත්ත නිල් පැත්ත එකිනෙකට යාබදව ඇත.

(f) රතු පැත්ත ඇත්තේ ඝනකයේ යට මුහුණතේ ය.

15. කොළ පැත්තට යාබද පැති හතරේ වර්ණ,

(1) කළු , නිල්, දුඹුරු , රතු
(2) කළු, නිල් , රතු , සුදු
(3) කළු , නිල් , දුඹුරු , සුදු
(4) කළු , දුඹුරු, රතු , සුදු
(5) නිල් , දුඹුරු, රතු , සුදු

16. 2026 වසරේ පැවැත්වීමට නියමිත පාපන්දු ලෝක කුසලානයේ සත්කාරකත්වය දරන රටවල් වනුයේ,

(1) ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, මෙක්සිකෝව
(2) ආජන්ටිනාව, මෙක්සිකෝව, පෘතුගාලය
(3) ජපානය, චීනය, දකුණු කොරියාව
(4) ප්‍රංශය, ස්පාඤ්ඤය, ජර්මනිය
(5) එංගලන්තය, ඉතාලිය, පෝලන්තය

17. පාහියන් නම් චීන භික්ෂුව ශ්‍රී ලංකාවට පැමිණෙන අවධියේ මෙරට පාලකයා වූයේ,

(1) I වන අගබෝ රජු
(2) බුද්ධදාස රජු
(3) ධාතුසේන රජු
(4) වසභ රජු
(5) මුගලන් රජු

18. පුනරුද සමයේ චිත්‍රයට නගන ලද "ක්‍රිස්තුස් වහන්සේගේ අන්තිම භෝජන සංග්‍රහය" විශ්ව කලා නිර්මාණය කාගේද?

(1) මයිකල් ආන්ජලෝ
(2) ලියනාඩෝ ඩාවින්සි
(3) රෆායල්
(4) මැසෙක්ෂියෝ
(5) බොට්ටි චෙල්ලි


19. 2025 වර්ෂයේ දී NATO සමුළුව පැවැත්වූයේ කොහේද?

(1) නෙදර්ලන්තයේ
(2) පෝලන්තයේ
(3) එංගලන්තයේ
(4) බ්‍රසීලයේ
(5) ප්‍රංශයේ






20. 2025 වර්ෂයේ බ්‍රික්ස් "BRICS" සංවිධානයට අලුතින් එකතු වූ රට කුමක් ද?

(1) මැලේසියාව
(2) පිලිපීනය
(3) කොරියාව
(4) ඉන්දුනීසියාව
(5) ස්විට්සර්ලන්තය

21. ඉහත දැක්වෙන අනුක්‍රමයෙහි ඊළඟ රූපයේ පහත දැක්වෙන දැයින් කුමක් ද?



ඉහත දැක්වෙන අනුක්‍රමයෙහි ඊළඟ රූපය පහත දක්වෙන දැයින් කුමක්ද?

(1) 
(2) 
(3) 
(4) 
(5) 



CamScanner

22. ඊළඟ අගය කුමක් ද?

4 , 9 , 19 , 39 , ....

(1) 78 (2) 79 (3) 80 (4) 77 (5) 76

23. A හා B දුම්රිය ස්ථාන දෙකක් පිහිටා ඇත. කෙළින් විහිදුනු දුම්රිය මාර්ගයක දුම්රියක් ඒකාකාර වේගයෙන් ගමන් කරයි. දුම්රිය 200 m ක් දිග A දුම්රිය ස්ථානයක් පසු කිරීමට 10 s ක් ගන්නා අතර 300 m ක් දිග B දුම්රිය ස්ථානයක් පසු කිරීමට 14 s ක් ගනී. දුම්රියේ දිග කීයද?

(1) 30 m (2) 35 m (3) 40 m (4) 45 m (5) 50 m

24. ශ්‍රී ලංකාවේ පළමු මැතිවරණය පැවැත් වූ වර්ෂය කුමක්ද?

(1) 1936 (2) 1945 (3) 1947 (4) 1952 (5) 1956


25. නෙල්සන් මැන්ඩලා ජාතික වීරයෙක් වූ රට කුමක් ද?

(1) නයිජීරියාව (2) සෝමාලියාව (3) දකුණු අප්‍රිකාව
(4) සොමිනෝ (5) බොට්ස්වානා


26. එක්තරා ප්‍රාථමික විද්‍යාලයක සිසුන්ගෙන් 25 % කගේ වයස අවුරුදු නවයට වඩා අඩුවන අතර වයස අවුරුදු නවයට වඩා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාව අවුරුදු නවයක් වයසැති ශිෂ්‍ය සංඛ්‍යාව 2/5 කට සමාන වේ. අවුරුදු නවයක් වයසැති ශිෂ්‍ය සංඛ්‍යාව 45 ක් නම් මෙම විද්‍යාලයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කීයද?

(1) 84 (2) 88 (3) 100 (4) 120 (5) 121

27.



ඉහත දී ඇති රූප තුනෙන් එක්තරා අනුපිළිවෙලක් දක්වයි. පහත සඳහන් කවරක් එම අනුපිළිවෙලෙහි ඊළඟ රූපය පෙන්වයිද?




28. එක්තරා පාසලක අ.පො.ස උසස් පෙළ ජෛව විද්‍යා, භෞතික විද්‍යා හා වාණිජ්‍ය යන විෂය ධාරාවල සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 5 : 7 : 8 අනුපාතයට වෙයි. මෙම පාසල ඊළඟ වර්ෂයේ දී එම විෂය ධාරා හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 40 % කින් 50 % කින් සහ 75 % කින් වැඩි කිරීමට සැලසුම් කරයි. එසේ වැඩි කලවිට ශිෂ්‍ය සංඛ්‍යාවල අනුපාතය කුමක්වනු ඇතිද?

(1) 2 : 3 : 4 (2) 2 : 3 : 5 (3) 2 : 3 : 6 (4) 3 : 4 : 5 (5) 6 : 7 : 8

29. කාංචනා උපදින විට ඇගේ පියාගේ වයස අවුරුදු 35 ක් ද, කාංචනාට වඩා අවුරුදු 4 ක් බාල ඇගේ සොයුරිය උපදින විට ඇගේ මවගේ වයස අවුරුදු 30 ක් විය. කාංචනාගේ දෙමව්පියන්ගේ වයස් පරතරය කොපමණද?

(1) අවුරුදු 1 (2) අවුරුදු 3 (3) අවුරුදු 5
(4) අවුරුදු 6 (5) අවුරුදු 9



30. කොස්තා මහතා සිය අන්තිම කැමති පත්‍රයෙහි පහත සඳහන් පරිදි දරුවන් තිදෙනා අතර සිය වත්කම් බෙදා දුන්නේ ය. වැඩිමහල් පුතා රු. මිලියන 17.5 ක් වටිනා ව්‍යාපාරික වත්කම





දියණිය රු. මිලියන 12.5 ක් වටිනා පොල් ඉඩම.

බාල පුතා රු. මිලියන 15 ක් වටිනා නිවස

ඊට අමතරව කොස්තා මහතා ඔහුගේ බැංකු ගිණුමෙහි මුළු මුදල වන රු. මිලියන 50 න් 50 % ක් වැඩිමහල් පුතා හා දියණිය අතර සමාන ප්‍රමාණ වලින් ද ඉතිරි 50 % බාල පුතාට ද වෙන් කළේය. කොස්තා මහතාගේ වත්කම් වැඩිමහල් පුතා, දියණිය සහ බාල පුතා වෙත පිළිවෙලින් කවර අනුපාතයට වෙන්කරනු ලැබුවේ ද?

(1) 2 : 3 : 4 (2) 3 : 2 : 5 (3) 3 : 4 : 6 (4) 5 : 6 : 7 (5) 6 : 5 : 8

31. එක්තරා අයුරකින්  රූපය  රූපයට සම්බන්ධ වෙයි. පහත දැක්වෙන රූප වලින් කුමක් ඒ අයුරින්ම  රූපයට සම්බන්ධ වෙයිද?

(1)  (2)  (3)  (4)  (5) 

32. ඔසෝන් ස්ථරය රැක ගැනීමට පිහිටුවා ඇති සංවිධානය වන්නේ,

(1) මොන්ට්‍රියෙල් සංවිධානය (2) බ්‍රික්ස් සංවිධානය

(3) ඔපෙක් සංවිධානය (4) නේටෝ සංවිධානය

(5) සාර්ක් සංවිධානය

33. ශිලා ලේඛනවල "රත්තිසා වැව" නමින් හඳුන්වන වැව,

(1) අභය වැව (2) කවුඩුලු වැව (3) පරාක්‍රම සමුද්‍රය

(4) තිසා වැව (5) මින්නේරිය වැව

34. ශ්‍රී ලංකාවේ බෞද්ධ කොඩිය ප්‍රථම වරට සකස් කළ වසර වන්නේ,

(1) 1845 (2) 1915 (3) 1885 (4) 1948 (5) 1931

35. බැඩ්මින්ටන් ක්‍රීඩාව ජාතික ක්‍රීඩාවක් වන්නේ කුමන රටේද?

(1) ඉන්දියාව (2) නවසීලන්තය (3) පකිස්ථානය

(4) මැලේසියාව (5) පින්ලන්තය

36. A , B ට වඩා තුන් ගුණයක් වේගයෙන් දුවයි. B , A ට වඩා 100 m ක් ඉදිරියෙන් ඉඳිමින් තරග දිවුමක් ආරම්භ කරයි. A , B පසු කරන වේලාවේදී B විසින් දුවන ලද දුර ප්‍රමාණය වන්නේ,

(1) 25 m (2) 50 m (3) 75 m (4) 100 m (5) 125 m

37. අමල් කමල්ට වඩා වැඩි වේගයෙන් දුවන අතර නිමල්ට වඩා අඩු වේගයෙන් දුවයි. බිමල් අමල්ට වඩා වේගයෙන් දුවයි. මෙම තොරතුරු පදනම් කරගෙන එළඹිය හැකි නිගමනය මින් කුමක්ද?

(1) වේගවත්ම ධාවකයා අමල් ය.

(2) වේගවත්ම ධාවකයා කමල් ය.

(3) අමල් දෙවන වේගවත් ධාවකයා ය.


(4) බිමල් තෙවන වේගවත් ධාවකයා ය.

(5) අමල් තෙවන වේගවත් ධාවකයා ය.

38. නිර්මාණකරුවන් සහ ඔවුන්ගේ නිර්මාණයේ වර්ගයන් නිවැරදිව ගැලපී නැත්තේ පහත සඳහන් කවරක් ද?
(1) මාටින් වික්‍රමසිංහ මහතා - නවකතා
(2) ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් - චිත්‍රපට
(3) ආචාර්ය ඩබ්.ඩී අමරදේව - සංගීතය
(4) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර - නාට්‍ය
(5) ජෝර්ජ් කීට් මහතා - මූර්ති කලාව

39. සූර්යයා මධ්‍යස්ථානය කරගත් ආකෘතිය "*Heliocentric Theory*" යැයි ප්‍රකාශ කළ ගණිතවේදියා කවුද?
(1) අයින්ස්ටයින් (2) ගැලීලියෝ ගැලිලි (3) කොපර්නිකස්
(4) නිව්ටන් (5) කෙප්ලර්

40. විශ්ව ගුරුත්ව නියමය සොයාගත් විද්‍යාඥයා කවුද?
(1) අයින්ස්ටයින් (2) ගැලීලියෝ (3) නිව්ටන් (4) කෙප්ලර්
(5) පයිතගරස්

41.

A B C

ඉහත දැක්වෙන A , B එක් එක් රූප සටහනේ දැක්වෙන තරාදි දෙකේ වම් පැත්තේ හා දකුණු පැත්තේ දක්වා ඇති ද්‍රව්‍ය බරින් තුල්‍ය වේ. C තරාදියේ වම්පස හා දකුණුපස ද්‍රව්‍යවල බර තුලනය වීමට එහි දකුණුපසට එක් කළ යුත්තේ පහත දැක්වෙන ඒවායින් කුමක් ද?
(1) ○□ (2) △△□ (3) △△△ (4) ○△□ (5) △△○

42. එක්තරා සංවිධානයක් තම වාර්ෂික මහ රැස්වීම සෑම වසරකම ජනවාරි මස අන්තිම සෙනසුරාදා දින පවත්වයි. පහත ඇති ප්‍රකාශ වලින් නිවැරදි කුමක් ද?
(I) වාර්ෂික මහ රැස්වීම පවත්වන්නේ ජනවාරි මස හතරවන සෙනසුරාදා ය
(II) වාර්ෂික මහ රැස්වීම කිසිම වසරක ජනවාරි මස 22 වන දින පවත්වන්නේ නැත.
(III) වාර්ෂික මහ රැස්වීම එකකට පසු එකක් පෙළියට එන වසර දෙකක එකම දිනයක පැවැත්විය නොහැක.
(1) එකක්වත් නැත (2) I පමණි. (3) I හා II පමණි.
(4) III පමණි. (5) II හා III පමණි.

43. මුද්‍රණ යන්ත්‍රය පළමුවරට නිපදවූයේ කවුරුන් විසින් ද?
(1) ජොහැන්ස් ගුටන් බර්ග් (2) නිකලස් කොපර්නිකස්
(3) මයිකල් ෆැරඩේ (4) ජොහැන්ස් කෙප්ලර්
(5) මයිකල් සර්වෙස්

44. මුද්‍රණ යන්ත්‍රයක් එක් පිටුවක් මුද්‍රණය කිරීමට තත්පර 3 ක් ගන්නා අතර සෑම විනාඩි 30 කට පසුව විනාඩි 5 ක් යන්ත්‍රය සිසිල් වීමට නවතා තැබිය යුතුය. පිටු 3600 ක් මුද්‍රණය කිරීමට ගතවන කාලය කොපමණද?
(1) පැය 3 (2) විනාඩි 1800 (3) පැය 3 විනාඩි 25
(4) විනාඩි 210 (5) විනාඩි 205

45. වසර 2041 වනවිට ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 25 % ක් අවුරුදු 60 ට වඩා වයසක අය වේ. මෙයට දායක විය හැකි හේතුවන්නේ

(I) වඩාත් දියුණු වූ වෛද්‍ය පහසුකම්

(II) උපත් අනුපාතයේ වර්ධනය

(III) උපත් අනුපාතයේ අඩුවීම

(IV) ප්‍රශ්න නිසා මිනිසුන් ඉක්මනින් මහලු වීම

මේ අතුරින්,

(1) I හා III පමණක් නිවැරදි ය. (2) I හා II පමණක් නිවැරදි ය.
(3) I පමණක් නිවැරදි ය. (4) II පමණක් නිවැරදි ය.
(5) I , III හා IV පමණක් නිවැරදි ය.

46. ලෝකයේ වඩාත් ම කුඩා මහද්වීපය කුමක් ද?

(1) යුරෝපය (2) ඕස්ට්‍රේලියාව (3) අප්‍රිකාව
(4) ආසියාව (5) දකුණු ඇමරිකාව

47. පළමුවැනි ලෝක යුද්ධය පැවති කාල සීමාව

(1) 1900 - 1910 (2) 1920 - 1924 (3) 1914 - 1918
(4) 1916 - 1925 (5) 1924 - 1928

48. ගරිල්ලා සංවිධානයක්, GMPMPX යන පණිවිඩය FOLLOW ලෙස විකේතනය කළහ. ඔහු ATTACK යන වචනය කෙසේ කේතනය කරනු ඇති ද?

(1) BDDBUL (2) BUUBDL (3) FDJKTR
(4) LDDLBU (5) UDBILB

49. Mount Everest පිහිටා ඇත්තේ කුමන රාජ්‍ය දෙකේ සීමාවේද?

(1) නේපාලය - චීනය (2) භාරතය - නේපාලය (3) භූතානය - චීනය
(4) නේපාලය - භූතානය (5) චීනය - මියන්මාරය

50. ලෝකයේ දිගුම නදිය කුමක්ද?

(1) ඇමසෝන් (2) නයිල් (3) යැන්ග්ට්සි (4) ගංගා (5) මිසිසිපි

AL API ( PAPERS GROUP )



CamScanner

AL API

PAPERS GROUP

CamScanner